**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක්/ 500 ට වැඩි) ------------------------
4. කලාපය : ------------------------
5. පළාත : ------------------------

| **8 ශ්‍රේණිය** | **පද්‍ය නිර්මාණ හා අවබෝධය** | **කාලය පැය 02** |
|---|---|---|

- I කොටසට අයත් **ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.
- II කොටයෙහි (අ), (ආ) යන කොටස්වල ඇතුළත් ප්‍රශ්න අතරින් **එක් ප්‍රශ්නයකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

(01) "යමන් කලුවේ ගෙදර යන්න කන්ද උඩින් අඳුර එනවා" යන වැකිය පද මාරු කරමින් අර්ථයට බාධා නොවන සේ පහත දැක්වෙන අයුරින් ලිපිය හැකි ය.

උදා: යමන් කලුවෙ ගෙදර යන්න කන්ද උඩින් අඳුර එනව
අඳුර එනවා කන්ද උඩින් යමන් කලුවෙ ගෙදර යන්න
ගෙදර යන්න යමන් කලුවෙ අඳුර එනව කන්ද උඩින්
කලුවෙ යමන් ගෙදර යන්න කන්ද උඩින් අඳුර

මෙය ආදර්ශයට ගෙන පහත වැකි අර්ථයට බාධා නොවන සේ පද හතර මාරු කරමින් ලියන්න.

i. ඔහොම කතා නොකරන් මස්සිනේ මට
ii. බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
iii. වැඩ කරන්න සැම එක්වෙති
iv. කුරක්කන් තුනයි වැපුරුවේ අමාරුවේ
v. ගුණදම් නිති වඩවලා
vi. විකසිත වී සුවඳින් නැහැවෙයි
vii. ඇගෙ ඇස් දෙකම අන්ධය එනමුත් පුදුම
viii. ඒ ගම මැදින් ගලනා ගඟ මනහරය
ix. තැති ගත් ඇයගේ දෑසින් බිය හෙමිහිට ගලා බසියි
x. වැලිදම් ගහ ඇයි ගෙඩි හංගන්නේ **(ලකුණු 1 X 10 = 10)**

(02) පහත සඳහන් පද්‍යවල විරිත රකිමින් සුදුසු පද පේළි සම්පූර්ණ කරන්න.

i. සඳේ එළිය විහිදිලා
තරු මල් ඇත පායලා
..............................................................................
..............................................................................

ii. .......................................................................

ගුණ නැණ බෙලෙන් යුතු දරුවන් තනන්නට
ඔබ ගත් වෙහෙස ගැන මට බෑ කියන්නට
.......................................................................

iii. .......................................................................
.......................................................................
බාධක දුරුර කඳුහෙල් ගල් බොරළු පිස
ගලනා ගඟකි ලෝ සත වෙත යොමා ඇස

iv. දස මස් කුස දරා දරුවන් බිහි කෙරුවා මවුනි
.......................................................................
ගෙදර බුදුන් ලෙස සැමදා නම් දැරුවා මවුනි
.......................................................................

v. හේනේ පැලේ නිදි මරලා
.......................................................................
.......................................................................
ගොවිතැන් බත් සරි කරලා

(ලකුණු 2 X 5 = 10)

(03) පහත පැදි පෙළ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

යමු යමු සොඳුර රන්වන් හිරු එළිය සිප
රජ දහනට ඉගිළී යමු අපට කැප
වන දෙව්ලොවේ වලඳන්නට සියලු සැප
ලස්සන කැදැල්ලක් බැඳ ගත යුතු ය අප

නිවහල් දිවි පෙවෙත අරඹා වන වාසී
නැළවෙමු මිනිස් කටහඬ කනකට නැසී
සපයා පුළුන් වැට පරඬැල් පෙඳ පාසී
ගෙය ගොඩ නැගුම මහ වනයෙහිම ය වාසී

ළංවිය නොහි ජනපදවල කුණු කසළ
සුව ජනක ව පෙනේ මිටියාවත නිසල
අප නිදහසේ හැසිරෙමු ඇළ දොළ අසල
අපටත් සොඳුර සැහෙයි අප සතු කුසල

i. කවි පෙළින් මතු කරන්නේ කුමන ජීවියෙක් පිළිබඳව ද?
ii. මහ වනයේ ගෙය ගොඩ නැගීම වාසි සහගත වන්නේ ඇයි?
iii. වනය සුවදායක වීමට හේතුවන මෙහි සඳහන් කරුණක් ලියන්න.
iv. මොවුන් නිදහසේ සැරි සැරිමට බලාපොරොත්තු වන ස්ථානය කුමක් ද?
v. පරිසරයට අහිතකර ලෙස බලපාන මිනිස් ක්‍රියාකාරකමක් මෙහි දැක්වේ. ඒ කුමක් ද?

(ලකුණු 2 X 5 = 10)

(04) පහත සඳහන් කවි පැනවලට කවියෙන් පිළිතුරු සපයන්න.

i. පැනයක් ඇත පුංචි පුතේ පිළිතුරු දෙන්න
නොරටින් එන දේට ආස ඇයි ද කියන්න?

පිළිතුර ඃ ...............................................................................................
...............................................................................................

ii. පොල් ලෙලි තැලූ අතපය අද වාරු නැත
කන්ට බොන්ට අගහිගකම් නිමක් නැත
දරු මුණුපුරන් කොහිදැයි මා දන්නෙ නැත
අනේ පුතේ පිහිටක් වෙනවා ද? මට?

පිළිතුර ඃ ...............................................................................................
...............................................................................................
...............................................................................................
...............................................................................................

iii. සෙල්ලම් ගෙ පාලුවෙන්න හේතුව මන්ද?
අමර තිලක දැන් සෙල්ලම් කරන්නෙ නැද්ද?
නිවාඩුවක් විවේකයක් ලබෙන්නේ නැද්ද?
ළමා ලොවේ සුන්දර බව කොහි සැඟවුණි ද?

පිළිතුර ඃ ...............................................................................................
...............................................................................................
...............................................................................................
...............................................................................................

iv. උදයට හිරු කුමරු ඇවිත් ලොව සරසන්නේ
මිහි මඬලම සුර පුරයක් වාගෙ පෙනෙන්නේ
මල් පෙති මත පිනි වැටිලා හරිම හැඩයිනේ
රෑට මලට පිනි ඉහින්නේ කවුද? කියන්න?

පිළිතුර ඃ ...............................................................................................
...............................................................................................
...............................................................................................
...............................................................................................

v. හිටගෙන ඉන්න ඇවිදින්නට කම්මැලි ය
දරුවන් දැන් කන්නේ රස වස විය ය
පිළිකා මරුවා ලොව හැම තැන ගිලගෙන ය
ඉන් ගැළවෙන්නෙ කෙලෙස ද කිව්වොත් හොඳය

පිළිතුර ඃ ...............................................................................................
...............................................................................................
...............................................................................................
...............................................................................................

(ලකුණු 2 X 5 = 10)

(05) පහත දී ඇති චිත්‍රය හොඳින් නිරීක්ෂණය කොට සුදුසු මාතෘකාවක් යොදා කැමති විරිතකින් කාව්‍ය නිර්මාණයක් කරන්න.

සඳැස් නම් කවි 6 - 8 ක් විය යුතු ය

නිසඳැස් නම් පේළි 25 - 30 ක් අතර විය යුතු ය.



(ලකුණු 10)

## II කොටස

- (අ) කොටසින් හෝ (ආ) කොටසින් කැමති **එක් ප්‍රශ්නයක් තෝරා ගෙන** කාව්‍ය නිර්මාණයක් කරන්න.
- සඳැස් පද්‍ය පන්තියක් නම් කවි 6 - 8 ක් විය යුතු ය.
- නිසඳැස් පද්‍ය පන්තියක් නම් පේළි 25 - 30ක් අතර විය යුතු ය.

### (අ) කොටස

i. ගස් වැල් ද ඇඹරිලා සුළං වැල් ඇදෙනවා
අකුණු හඬ පැතිරිලා විදුලි එළි දුවනවා
කඩිමුඩියෙ කුරුල්ලෝ කැදැල්ලට වදිනවා
මහ වැස්ස පොළාව වෙත ඇදෙන්නට හදනවා

(මාතෘකාව - වැසි බර දිනයක්)

ii. නාවා කවා නිතරම මගෙ ළඟ වූවා
කතන්දර කියා මා සිත සැනසූවා
හොඳ ගුණදම් දී යහමග පෙන්වූවා
හැමදා නුඹ මගේ අත්තම්මා වේවා

(මාතෘකාව - මගේ අත්තම්මා)

### (ආ) කොටස

i. කූඩුවක සිටින ගිරවෙකු හා නිදහසේ සිටින ගිරවෙකු අතර වන සංවාදය කවියට නගන්න.

ii. මහලු මඩමක තනිවුණු පියෙකුගේ සිතුවිලි කවියට නගන්න.

(ලකුණු 50)